# මධ්‍යම කඳුකරයේ නිල වශයෙන් පිළිගත් හා නොගත් සේවා මධ්‍යස්ථානයන්හී වර්ධනය ආශ්‍රිත ගැටලු

ආර්. එම්. කේ. රත්නායක
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
***ratnayake.rmk@gmail.com***

ශ්‍රී ලංකාව ආසියාතික කලාපය තුළ අඩු නාගරීකරණයක් සහිත රටක් ලෙස නාගරීකරණ අනුපාතය මත හඳුනාගත හැකියි. 2001 සංගනණයට අනුව ශ්‍රී ලංකාවේ නාගරීකරණය 16,5% කි. මෙය ජාතික නිර්ණායක මත තීරණය වන අගයක් වුවද ප්‍රායෝගිකව ගත්කල රට තුළ ඉහළ නාගරීකරණ මට්ටමක පවතියි. කලින් කලට රජය විසින් වෙනස් කරනු ලබන නිර්ණායක වල බලපෑම හා නිෂ්චිත නිර්ණායක නගර වෙන් කිරිම සඳහා භාවිතා නොකිරිමෙන් නගර ප්‍රමාණයන්හී වෙනස්කම් පවතියි. එමෙන්ම රටේ ආර්ථිකයට ඍජු ලෙසම දායකවන සේවා මධ්‍යස්ථාන අතරින් බොහෝමයන් නිර්ණායක වලට අනුව නගර ලෙස නොපිළිගත්තද ප්‍රදේශයේ සංවර්ධනයට එවායින් මහගු දායකත්වයක් ඉටුකරනු ලබයි. මේ නිසාම සංවර්ධනයේ උපකරණයක් ලෙස නගර පිළිබඳව අවධානය යොමු කිරිම කාලෝචිතය. බොහෝවිට නගර වල ක්‍රියාකාරිත්වය පිළිබඳව හෝ ප්‍රධාන නගර ආශ්‍රිතව පවතින සුවිශේෂිත වූ ගැටලු පිළිබඳ නිරන්තරයෙන් පර්යේෂණ සිදුකර ඒවා අවම කිරිම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබේ. එවායේ සාර්ථකත්වය කෙසේ වුවත් රට අභ්‍යන්තරයේ පිහිටි, විශාල වශයෙන් වර්ධනයක් නොපෙන්වන එහෙත් දැනට වඩා විශාල සේවයක් අවට ප්‍රදේශයට සිදුකළ හැකි නගරවල පවතින ගැටලු රටේ අනෙකුත් ප්‍රධාන නගරවලට වඩා වෙනස්ය.

විශාල වර්ධන විභවතාවක් සහිත නාගරික මධ්‍යස්ථාන වල පවතින ගැටලු අඩු නාගරික වර්ධනයක් සහිත නගර හෝ නාගරික නොවන සේවා මධ්‍යස්ථාන වලට වඩා සංකිර්ණය. එමෙන්ම සෑම අංශයකින්ම ප්‍රබල පර්යන්තයක් සහිත නගර වලට වඩා දුර්වල පර්යන්තයක් සහිත ප්‍රදේශ වල පවතින්නේ හාත්පසින්ම වෙනස්වූ ගැටලුය. ඉහළ ගණයේ සේවා සපයන, විශාල ජනසංඛ්‍යාවක් දෛනිකව පැමිණෙන, ප්‍රබල ගැටලු රාශියක් සහිත නගර වලට වඩා ඇතැම් සේවා මධ්‍යස්ථාන වල සේවාවන් ප්‍රමාණවත් නොවීම, ශක්තිමත් පර්යන්තයක් නොමැතිවීම, පරිපාලනමය වශයෙන් පවතින්වූ දුර්වලතාවන් මෙන්ම සේවා මධ්‍යස්ථානයේ වර්ධනයට පවතින විවිධාකාරවූ භෞතික මෙන්ම සමාජ-ආර්ථික බාධාවන්ද හඳුනාගත හැකිය. එමෙන්ම ශ්‍රී ලංකාවේ නාගරීකරණයේ විවිධ මට්ටම් අනුව හඳුනාගත හැකි කලාපයන් වශයෙන් වෙරළබඩ තැනිතලා ප්‍රදේශය, වියළි කලාපය, මධ්‍යම කඳුකරය ආදී වශයෙන් වෙන් වෙන්ව සැලකුවද ඒවායේ පවතින ගැටලු වල ස්වභාවය හා කාලීනව ඇතිවන්නාවූ වෙනස්කම් ඉතා පැහැදිලිවම හඳුනාගත හැකිය. මෙලෙස පවතින සුවිශේෂිත වූ ගැටලු හඳුනා ගැනීම හා එම ගැටලු විසඳීම සඳහා පවතින හැකියාවන් කෙරෙහි අවධානය යොමු කිරිමද කාලෝචිත වන්නේය. එහෙත් මෙතෙක් හඳුනා ගනු ලැබූ ගැටලු, එම ගැටලු නිරාකරණය කිරිමට ගත් ක්‍රියාමාර්ගයන්හී සාර්ථකත්වය, තවදුරටත් පවතින්නාවූ හා අවධානයට ලක්නොවූ එහෙත් සේවා ම්‍යස්ථානයක කාර්යක්ෂමතාව පවත්වා ගෙනයාම සඳහා

ක්‍රියාත්මක කළ යුතුව ඇති අංශ කෙරෙහිද සැලකිලිමත් වෙමින් යෝජනා ඉදිරිපත් කිරිමත් මෙහිදී අවධානයට ලක් කෙරිණ.

පර්යේෂණය සඳහා මූලික වශයෙන් වතු වගාව හා එළවලු වගාව ආශ්‍රිතව පැනනැංගාවූ නාගරික මධ්‍යස්ථාන වශයෙන් සලකන හපුතලේ හා බණ්ඩාරවෙල නගර සභා දෙකත් 1987 න් පසුව නාගරික තත්ත්වයෙන් ඉවත් වූ එහෙත් ප්‍රදේශයට තවමත් ඒ ආකාරයෙන්ම සේවාවන් සපයන හාලිඇල සේවා මධ්‍යස්ථානයත් තෝරා ගන්නා ලදී. ප්‍රධාන වශයෙන් නිරික්ෂණය හා සාකච්ඡා මාර්ගික ක්‍රමවේදයන් ඔස්සේ අදාල දත්ත රැස්කිරිමත් ආයතන සතු දත්ත භවිතයත් ප්‍රධාන විය. න්‍යායාත්මක පසුබිමට වඩා ප්‍රායෝගිකත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සැබෑ ලෙසම ව්‍යාපාරිකයින් හා පාරිභෝගිකයින් දෛනිකව මුහුණපාන ගැටලු කෙරෙහි අවධානය යොමු කරන ලදී. ගුණාත්මක දත්ත විශ්ලේශනය මෙහිදී ප්‍රධාන වන අතර අවශ්‍ය අවස්ථාවන් වලදී සරළ සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම ශිල්පයන් භාවිතයට ගන්නා ලදී.

මධ්‍යම කඳුකරයේ බොහෝමයක් නගර මුහුණපාන ප්‍රබලම ගැටලුව වන්නේ නගර පුලුල් කිරිමේදී භෞතික සාධකයන්ගේ බලපෑමයි. විශේෂයෙන් මෙම අධ්‍යයනය සඳහා ඉලක්කවූ නගර සභා දෙකම භෞතිකමය වශයෙන් නගර පුලුල් කිරිම සඳහා දැඩි ලෙස බලපෑමට ලක්වන ප්‍රදේශයන් බැවින් එවැනි ක්‍රියාදාමයන්ගේ ස්වභාවය හඳුනා ගන්නා ලදි. එමෙන්ම පර්යන්තයේ ආර්ථිකය ශක්තිමත් නොවීම මෙම නගරවල මන්දගාමී වර්ධනයට ප්‍රධාන හේතුවක්ද වී ඇත.

***ප්‍රමුඛ පදඃ*** *මධ්‍යම කඳුකරයේ නගර, නාගරීකරණය, නාගරික ගැටලු, පර්යන්තය, සේවා මධ්‍යස්ථාන*